    නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

01) මල්වලට හානි කරන සතකු නොවන්නේ,

1) කුරුමිණියා    2) ලේනා

3) වවුලා    4) කණාමැදිරියා

02) ඖෂධීය පානයක් ලෙස යොදා ගන්නා මල් විශේෂය වන්නේ,

1) කතුරුමුරුංගා    2) හාතවාරිය

3) ගොටුකොළ    4) බෙලි

03) රතු සහ කහ වර්ණ මිශ්‍ර කිරීමෙන් සෑදෙන වර්ණය වන්නේ,

1) රෝස    2) දම්

3) තැඹිලි    4) දුඹුරු

04) පොදුවේ පරිහරණය කරන උපකරණයක් වන්නේ,

1) දත්බුරුසුව    2) ලේන්සුව

3) සපත්තු    4) විදුලිපංකාව

05) ශ්‍රී ලංකාවේ උසම දියඇල්ල වන්නේ,

1) දියලුම ය.    2) බඹරකන්ද ය.

3) බේකර්ස් ය.    4) දුන්හිඳ ය.

06) යකඩ ඌණතාවයෙන් ඇතිවන ආබාධය වන්නේ,

1) කෙණ්ඩාපෙරළීම    2) රක්තහීනතාවය

3) ගලගණ්ඩය    4) කුරුබව

07) ඇස් හැරවිය නොහැකි සතා වන්නේ,

1) ගවයා    2) නයා    3) කපුටා    4) බල්ලා

08) ආහාරකල් තබා ගැනීමේ දිගු කාලීන ක්‍රමයක් වන්නේ,

1) වියළීම 2) ලුණුදැමීම 3) පිසීම 4) ශීතකිරීම

09) නිතර පියාඹන පක්ෂියකු නොවන්නේ,

1) උකුස්සා 2) පරෙවියා 3) කුකුළා 4) ගිරවා

10) ව්‍යාංජනයක් ලෙස ආහාරයට ගන්නා මල් වර්ගයක් වන්නේ,

1) රණවරා 2) නෙල්ලි 3) කතුරුමුරුංගා 4) බෙලි

11) හින්දු භක්තිකයන්ගේ පූජනීය ස්ථානය වන්නේ,

1) කෝවිල 2) දේවාලය 3) පල්ලිය 4) මස්ජිදය

12) නිල්වලා ගඟ මුහුදට වැටෙන ස්ථානය වන්නේ,

1) ගිංතොට 2) අම්බන්තොට 3) මාතර 4) කළුතර

13) ශ්‍රී ලංකාවේ අන්තර් ජාතික ගුවන්තොටුපොළ පිහිටා ඇති ස්ථානය වන්නේ,

1) රත්මලාන 2) පලාලි 3) කටුනායක 4)

ත්‍රිකුණාමලය

14) ගොවීන් භාවිත කරන වැඩ පහසු කරන උපකරණයක් වන්නේ,

1) මට්ටම් ලීය 2) මනිස් ලෑල්ල 3) පෝරුලෑල්ල 4) සවල

15) හඳ දැක ගත නොහැකි පෝය දිනය වන්නේ,

1) අමාවක 2) අවඅටවක

3) පුරඅටවක 4) පසළොස්වක

16) ශ්‍රී ලංකාවේ ප්‍රථම රාජධානිය ලෙෂ සැලකෙන්නේ,

1) කෝට්ටේ 2) අනුරාධපුරය 3) පොළොන්නරුව 4) දඹදෙනිය

17) වඩු කාර්මිකයන් පරිහරණය කරන උපකරණයක් වන්නේ,

1) රේක්කය 2) නඟුල 3) බුරුමය 4) ලඹය

18) විද්‍යුත් චුම්භකයක් තැනීමේදී ඒ සඳහා යොදාගත යුත්තේ,

1) රිදී ඇණයකි 2) ඇලුමිනියම්ඇණයකි

3) යකඩඇණයකි 4) පිත්තල ඇණයකි

19) සුළඟේ පාවී පැතිරී යන බීජයක් වන්නේ,

1) හොර 2) පොල් 3) රබර් 4) කජු

20) ගවයාට පුද පූජා පවත්වන ආගම වන්නේ,

1. හින්දු 2. ඉස්ලාම් 3. ක්‍රිස්තියානි 4. බෞද්ධ